# තනතුරු ඇබෑර්තු
# ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයෙහි පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති ස්වාමීන් වහන්සේලා සහ පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| බාණ්ඩය | අනු අං. | තනතුරු නාමයන් | වැටුප් පරිමාණය වි.ප්‍ර.කො.සභා චක්‍රලේඛ අංක. 02/2025 සහ 02/2025(i) | තනතුරු ඇබෑර්තු |
|---|---|---|---|---|
| අධ්‍යයන | i | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | Rs. 160,520-7x3,900-187,820 p.m. [U-AC 3(I)]<br>අධ්‍යයන දීමනාව 116%+ Rs 2200/- ජීවන වියදම් දීමනාව Rs 17800/- | 03 |
| | | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | Rs. 138,980-11x2,940-171,320 p.m. [U-AC 3(II)]<br>අධ්‍යයන දීමනාව 116%+ Rs 2100/- ජීවන වියදම් දීමනාව Rs 17800/- | |
| | | කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ) | Rs. 121,340-5x2,940-136,040 p.m. [U-AC 3(III)]<br>අධ්‍යයන දීමනාව 102%+ Rs 1800/- ජීවන වියදම් දීමනාව Rs 17800/- | |
| | | කථිකාචාර්ය (ආධුනික) | Rs. 94,400-10x2,400-118,400 p.m. [U-AC 3(IV)]<br>අධ්‍යයන දීමනාව 91%+ Rs 1200/- ජීවන වියදම් දීමනාව Rs 17800/- | |
| | | ▪ බෞද්ධ හා පාලි අධ්‍යයන අංශය - විෂය - පාලි (පුරප්පාඩු සංඛ්‍යාව 01)<br>▪ සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය - විෂය-පුස්තකාල හා විඥාපන විද්‍යාව සහ දර්ශනය (පුරප්පාඩු සංඛ්‍යාව 02)<br>▪ වි.ප්‍ර.කො.සභා චක්‍රලේඛ අංක. 721, 935, 08/2016, 08/2016 (i), 08/2016 (ii) සහ 07/2018<br>▪ සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගනු ලැබේ. | | |
| අනධ්‍යයන | ii | විගණන සහකාර II ශ්‍රේණිය (අභ්‍යන්තර සහ බාහිර) | Rs. 61,275-18x890-77,295 p.m. [U-MN 2(II)]<br>MCA 36%-330/- + ජීවන වියදම් දීමනාව Rs 17,800/- | 01 |
| | | වි.ප්‍ර.කො.සභා චක්‍රලේඛ අංක.05/2020 | සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගනු ලැබේ. | |
| | iii | කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (අභ්‍යන්තර සහ බාහිර) | Rs. 49,475-17x540-58,655 p.m. [U-MN 1(III)]<br>MCA 36%-330/- + ජීවන වියදම් දීමනාව Rs 17,800/- | 04 |
| | | වි.ප්‍ර.කො.සභා චක්‍රලේඛ අංක. 06/2018 | ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගනු ලැබේ. | |
| | iv | රියදුරු III ශ්‍රේණිය (පුහුණු) (අභ්‍යන්තර සහ බාහිර) | Rs 48,005-16x490 - 55,845 p.m [U- PL 3(III)]<br>MCA 36%-330/- + ජීවන වියදම් දීමනාව Rs 17,800/- | 03 |
| | | වි.ප්‍ර.කො.සභා චක්‍රලේඛ අංක. 14/2024 (ඇමුණුම III) - | ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගනු ලැබේ. | |
| | v | කෙයාර්ටේකර් කම් කුක් III ශ්‍රේණිය (අර්ධ පුහුණු) (අභ්‍යන්තර සහ බාහිර) | Rs. 44,575-16x490 - 52,415 p.m. [U- PL 2(III)]<br>MCA 36%-330/- + ජීවන වියදම් දීමනාව Rs 17,800/- | 01 |
| | | වි.ප්‍ර.කො.සභා චක්‍රලේඛ අංක.14/2024 (ඇමුණුම II) - | ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගනු ලැබේ. | |
| | vi | පුස්තකාල සහයක III ශ්‍රේණිය (නුපුහුණු) (බාහිර) | Rs. 42,775 - 16x450 - 49,975 p.m. [U- PL 1(III)]<br>MCA 36%-330/- + ජීවන වියදම් දීමනාව Rs 17,800/- | 01 |
| | | වි.ප්‍ර.කො.සභා චක්‍රලේඛ අංක. 14/2024 (ඇමුණුම I) - | ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගනු ලැබේ. | |
| | vii | වැඩ සහායක III ශ්‍රේණිය (නුපුහුණු) (බාහිර) | Rs. 42,775 - 16x450 - 49,975 p.m. [U- PL 1(III)]<br>MCA 36%-330/- + ජීවන වියදම් දීමනාව Rs 17,800/- | 03 |
| | | වි.ප්‍ර.කො.සභා චක්‍රලේඛ අංක.14/2024 (ඇමුණුම I) - | ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගනු ලැබේ. | |

**සටහන් :-**

- සෑම අයදුම්කරුවෙකුම,
  - ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුයි.
  - දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි හොඳින් ඉටුකිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
  - විශිෂ්ඨ හා සදාචාරාත්මක චරිතයක් විය යුතුයි.
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I/II ශ්‍රේණිය/කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)/ කථිකාචාර්ය (ආධුනික) තනතුරු සඳහා බෞද්ධ භික්ෂූන් වහන්සේලාට පමණක් අයදුම් කළ හැකි අතර, ඉංග්‍රීසි මාධ්‍යයෙන් ප්‍රථම උපාධිය හදාරන ලද අයදුම්කරුවන්ට සහ ත්‍රිපිටක අධ්‍යයනය පිළිබඳ විශේෂ උපාධිය ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව ලබා දෙනු ඇත.ඉංග්‍රීසි භාෂාවෙන් ඉගැන්වීමේ හැකියාව මෙම තනතුරු සඳහා අත්‍යාවශ්‍ය සුදුසුකමක් සේ සැලකේ.
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I/II ශ්‍රේණිය / කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)/ කථිකාචාර්ය (ආධුනික) තනතුරු සඳහා බඳවා ගත් පසු අවම වශයෙන් වසර 10 ක අනිවාර්ය සේවා කාලයක් මෙම විශ්වවිද්‍යාලයේ සේවය කිරීමට විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.

CamScanner

- අනධ්‍යයන තනතුරු සඳහා ගිහි පුද්ගලයන්ට පමණක් අයදුම්කළ හැකිය.
- රියදුරු තනතුරු සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය ලබා දේ.
- වයස් සීමාව
  - කළමනාකරණ සහකාර තනතුර සඳහා වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු සහ වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුය.
  - අනෙකුත් අනධ්‍යයන තනතුරු සඳහා අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු සහ වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
  - අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.
- ඉහත සඳහන් සියලු තනතුරු සඳහාවන සුදුසුකම්වලට අදාළ තොරතුරු ඇතුළත් බඳවාගැනීමේ පරිපාටි විශ්වවිද්‍යාලයේ www.busl.ac.lk වෙබ් අඩවිය තුළින්ලබා ගත හැකිය.

**ප්‍රතිලාභ:**

- ඉහත සඳහන් තනතුරු සඳහා වැටුප්වලට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත අනෙකුත් දීමනා ද හිමිවේ.
- විශ්වවිද්‍යාල සේවයට බඳවා ගනු ලබන අයට විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන සේවක අර්ථසාධක අරමුදලේ සමාජිකත්වය ලැබේ. (අර්ථසාධක අරමුදල සඳහා නිලධාරියාගේ වැටුපෙන් 10% ක මුදලක් සහ විශ්වවිද්‍යාලය මගින් 15% ක මුදලක් බැර කරනු ලැබේ.) සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට 3% ක මුදලක් විශ්වවිද්‍යාලය මගින් බැර කරනු ලැබේ.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහය (2023 වර්ෂයේ සංශෝධිත) ප්‍රකාරව අධ්‍යයන තනතුරු සඳහා වැටුප් සහිත සහ වැටුප් රහිත අධ්‍යයන නිවාඩු හිමිවේ.
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I/II තනතුරු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන සඳහාවන (2023 වර්ෂයේ සංශෝධිත) ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අනුව සප්ත වාර්ෂික නිවාඩු හිමිකම ඇත.

**අයදුම්පත්**

- නියමිත අයදුම්පත් හා අදාළ අනෙකුත් විස්තර 2026.08.20 දිනට ප්‍රථම මෙම විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී (ආයතන) වෙතට ඉල්ලුම් කරන තනතුර ඇතුළත් ලිපියක් සමග සෙ.මී. 23x10 ප්‍රමාණයේ ලිපිනය සහිත රු. 50.00ක මුද්දර ඇල වූ ලිපි කවරයක් එවීමෙන් ලබා ගත හැකි අතර අයදුම්පත් හා බඳවා ගැනීමේ මූලික සුදුසුකම් ඇතුළු විස්තර www.busl.ac.lk වෙබ් අඩවියෙන් ද බාගත හැකිය.

- එක් තනතුරකට අමතරව අයදුම් කිරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුවේ.

- අයදුම්පත්‍ර බාරගන්නා අවසන් දිනට සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**අයදුම්කරන පිළිවෙල**

- සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ සහතික පිටපත් සහ ඒට අදාළ ලේඛන සමග ලියාපදිංචි තැපෑලෙන් **සහකාර ලේඛකාධිකාරී (ආයතන) ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුර යන ලිපිනයට 2026.09.02 දින හෝ ඊට ප්‍රථම** ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

- විශ්වවිද්‍යාල/රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම් කරන අයදුම්රුවන්ගේ අයදුම්පත්‍ර, කාර්යාල ගත යොමුකිරීම් ක්‍රියාවලිය සැළකිල්ලට ගෙන අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දින සිට එනම් 2026.09.02 දින සිට 2026.09.16 දින දක්වා දින 14ක් වන කාලය තුළ ලැබෙන අයදුම්පත්‍ර පිළිගනු ලැබේ. අදාළ ආයතන ප්‍රධානීන් හරහා යොමු නොකරන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ ආකෘතියෙන් සහ තනතුරට අදාළ අයදුම්පත්‍රය මගින් ඉදිරිපත් කර නොමැති, ඉහත කොන්දේසිවලට පටහැනිව ඉදිරිපත් කරන ලද අසම්පූර්ණ හා අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- අයදුම්කරුවන් කෙටි ලේඛන ගත කිරීම හා එම අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුවේ.

**ලේඛකාධිකාරී**
**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය**
2026.08.09